# 2023/11/16 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/11/16 වන දින පෙ.ව.09.00ට ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරී ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා, කාර්මික නිලධාරී ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා, සංවර්ධන නිලධාරී ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරී කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම මහතා හා විෂය නිලධාරී පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) මහත්මිය විසින් 2023/10/26 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව කමිටු සාමාජිකයින් ඒකමතිකව අනුමත කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛණය සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල වවුචර්පත්

a. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛන

| අනු අංකය | නම හා විස්තරය | ගෙවූ මුදල | කමිටු තීරණය |
|---|---|---|---|
| 01. | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - නව බස්නැවතුම්පල නිරීක්ෂණය සහ සාකච්ඡා සඳහා සහභාගි වූ ගරු ආණ්ඩුකාරතුමා, රාජ්‍ය අමාත්‍යතුමා ඇතුළු නිලධාරින්ට සංග්‍රහ කිරීමට ලබාගත් අත්තිකාරම පියවීම. | 28,303.00 | නිර්දේශ කරන ලදී. |
| 02. | ආර්.එම්.මදුසිකා රත්නායක මිය, සංවර්ධන නිලධාරී - අයවැය සකස් කිරීමේ පුහුණු වැඩසටහන සඳහා පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානයට යාම වෙනුවෙන් 2023.11.07 මස ගමන් වියදම් ගෙවීම. | 700.00 | නිර්දේශ කරන ලදී. |
| 03. | එස්.එම්.ඒකනායක බණ්ඩා මයා, ආදායම් පරීක්ෂක(වැ.බ.) – 2023 සැප්තැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 2,500.00 | නිර්දේශ කරන ලදී. |
| 04. | එස්.එම්.ඒකනායක බණ්ඩා මයා, ආදායම් පරීක්ෂක(වැ.බ.) – 2023 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 2,500.00 | නිර්දේශ කරන ලදී. |
| 05. | පී,වාසනා නිල්මිණී මිය, සංවර්ධන නිලධාරී - පුරවැසි ප්‍රඥප්තිය QR කේතයට දත්ත ඇතුලත් කිරීම සඳහා ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුවට යාම වෙනුවෙන් 2023.11.03 දින ගමන් වියදම් ගෙවීම. | 1,000.00 | නිර්දේශ කරන ලදී. |
| 06. | පී,වාසනා නිල්මිණී මිය, සංවර්ධන නිලධාරී - භාෂා සැලසුම් සකස් කිරීම පිළිබඳ වැඩසටහන සඳහා ඌව පළාත් සභාවට යාම වෙනුවෙන් 2023.10.26 දින ගමන් වියදම් ගෙවීම. | 1,000.00 | නිර්දේශ කරන ලදී. |
| 07. | ජී.කාංචනා ද සොයිසා මිය, සංවර්ධන නිලධාරී - ඝණ අපද්‍රව්‍ය උපාය මාර්ගික සැලසුම් සැකසීම සඳහා පැල්ගහතැන්න පුහුණු ආයතනයට යාම වෙනුවෙන් 2023.11.02 දින ගමන් වියදම් ගෙවීම. | 1,300.00 | නිර්දේශ කරන ලදී. |
| 08. | කළමනාකරු, තව්‍ඳු පොත්හල, මීගහකිවුල - මීගහකිවුල/ පිටමාරුව/ කලුගහකඳුර පුස්තකාල සඳහා සැප්තැම්බර් මස පුවත්පත් බිල්පත් පියවීම. | 14,070.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 09. | කළමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - ජල යෝජනා ක්‍රම වල මීටර් අළුත්වැඩියා කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපකරණය මිළදී ගැනීම් සඳහා මිළ ගණන් පියවීම.(ස්පැනර් යතුරු 12, බිල්පත් අංකය - 1788) | 1,250.00 | නිර්දේශ කරන ලදී. |
| 10. | කෘෂි ආයුධ නිශ්පාදිකයෝ, එස්.ඩී.එන්.ප්‍රගීත් හේවත්ත, අරාව පාර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ කැති 03ක් අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් මිළ ගණන් පියවීම. | 3,000.00 | නිර්දේශ කරන ලදී. |
| 11. | කෘෂි ආයුධ නිශ්පාදිකයෝ, එස්.ඩී.එන්.ප්‍රගීත් හේවත්ත, අරාව පාර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ අලවංගු 02ක් අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් මිළ ගණන් පියවීම. | 2,400.0 | නිර්දේශ කරන ලදී. |
| 12. | කළමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ කාර්යාලයට හා පොදු පහසුකා මධ්‍යස්ථානයට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීම මිළ ගණන් පියවීම.( බිල්පත් අංකය - 1712) | 26,415.00 | නිර්දේශ කරන ලදී. |
| 13. | කළමනාකරු, දිනූෂා ට්‍රේඩ් ඒජන්සි, අංක 09, බසාර් වීදිය, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු වීදි ලාම්පු අළුත්වැඩියා කටයුතු සඳහා මිළදී ගත් ද්‍රව්‍ය සඳහා මිළ ගණන් පියවීම.(බිල්පත් අංක - 029) | 29,100.00 | නිර්දේශ කරන ලදී. |
| 14. | කළමනාකරු, අමා ක්‍රියේෂන්ස්, අංක 320, කැප්පෙටිපොළ මාවත, බදුල්ල - සිත්තම් අතරින් ගෙත්තම් චිත්‍ර ප්‍රදර්ශන තරඟාවලිය සහභාගී වූ දරුවන් සඳහා සහතික පත් මුද්‍රණය කිරීම සඳහා වැය වූ මුදල වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයේ අනුග්‍රහකත්වය යටතේ ගෙවීම් කිරීම. | 30,000.00 | නිර්දේශ කරන ලදී. |
| 15. | ආර්.එම්.නිල්මිණි සකුන්තලා මිය, කළමනාකරණ සේවා නිලධාරී - LDSP ව්‍යාපෘතිය BT 4 හා PT 3 යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා තෝරා ගැනීමේ වැඩසටහන සඳහා හාලිඇල ප්‍රාදේශීය සභාවට යාම වෙනුවෙන් 2023.11.09 මස ගමන් වියදම් ගෙවීම. | 700.00 | නිර්දේශ කරන ලදී. |
| 16. | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2023/03/19 දිනෙන් පසු සභා ලේකම් වෙත පැවරී ඇති බලතල, කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් 2023 ඔක්තෝම්බර් මස මාසික දීමනා ගෙවීම. | 20,000.00 | නිර්දේශ කරන ලදී. |
| 17. | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල 2023/10/12 දින සිට 2023/10/26 දින දක්වා පැවති කළමනාකරණ කමිටු දීමනා ගෙවීම. | 13,000.00 | නිර්දේශ කරන ලදී. |
| 18. | ටී.වසන්ති මිය, වර්ණසූරිය ඔටෝ සර්විස් ඇන්ඩ් මෝටර් ගරාජ්, 15 කණුව, මීගහකිවුල - 252-6368 කැබ් රථයේ වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම.( බිල්පත් අංකය-4209) | 37,050.00 | නිර්දේශ කරන ලදී. |
| 19. | එච්.ඩබ්.කේ.කවිෂ්ක සම්පත් මයා, චන්ද්‍රසිරි මෝටර්ස්, මීගහකිවුල - 270-1735 ට්‍රැක්ටර් රථය අළුත්වැඩියාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම.(බිල්පත් අංක -41) | 16,350.00 | නිර්දේශ කරන ලදී. |
| 20. | බී.එම්.හිරන්ත ලක්ෂාන් මයා, කාර්මික නිලධාරී - 2023 ජූනි මස පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම. | 5,950.00 | නිර්දේශ කරන ලදී. |
| 21. | ජේ.එම්.විජිත ප්‍රියන්ත මයා, රියදුරු - කාර්යාල රාජකාරී කටයුතු සඳහා යෑම වෙනුවෙන් 2023/10/01,03,12,13,16,17,20,22 දිනයන් සඳහා ගමන් වියදම් ගෙවීම. | 5,600.00 | නිර්දේශ කරන ලදී. |
| 22. | වයි.එම්.නුවන් හර්ෂණ මයා, රියදුරු - කාර්යාල රාජකාරී කටයුතු සඳහා යෑම වෙනුවෙන් 2023/10/01,09,10,11,16,17,18,30 දිනයන් සඳහා ගමන් වියදම් ගෙවීම. | 4,900.00 | නිර්දේශ කරන ලදී. |
| 23. | ඉන්ටෙල් හවුස්, අංක 08, ආර්.එච්.ගුණවර්ධන මාවත, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ පරිගණක අළුත්වැඩියා කටයුතු සඳහා මිළ ගණන් පියවීම.(බිල්පත් අංක -0000190) | 10,500.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 24. | ටී.වසන්ති මිය, වර්ණසූරිය ඔටෝ සර්විස් ඇන්ඩ් මෝටර් ගරාජ්, 15 කණුව, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු UPLL-7774 කැබ් රථය වාර සේවා කිරීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම.(බිල්පත් අංක - 4226) | 42,600.00 | නිර්දේශ කරන ලදී. |
| 25. | ඩී.එම්.ධනපාල මයා, පුබුදු කොන්ක්‍රීට් වර්ක්ස්, කෙසෙල්වත්ත - හෙලමල්වත්ත ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ජල නල උපාංග සහ උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. (7017020 ගිණුමෙන්) | 423,447.00 | නිර්දේශ කරන ලදී. |
| 26. | කළමනාකරු, සිංගර්-A ප්‍රධාන ශාඛාව, අංක 134, ප්‍රධාන වීදිය, බදුල්ල - හෙලවත්ත ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ජල මෝටර්යක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. (7017020 ගිණුමෙන්) | 72,400.00 | නිර්දේශ කරන ලදී. |
| 27. | කළමනාකරු, දිනුෂා ට්‍රේඩ් ඒජන්සි, අංක 09, බසාර් වීදිය, බදුල්ල - හෙලමල්වත්ත ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ජල නල උපාංග සහ උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. (7017020 ගිණුමෙන්) | 133,667.50 | නිර්දේශ කරන ලදී. |

- අනු අංක 19 අදාල ගෙවීම් වවුචර්පතෙහි ඇතුලත් 270-1735 ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියාව සිදු කිරීම සම්බන්ධයෙන් මිළ සාධාරණීකරනය ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරන ලෙස කමිටුව විසින් තීරණය කරන ලදී.

b. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

c. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා 2023 නොවැම්බර් මස වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

II. 2023.11.07 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් තුමිය විසින් සකස් කරන ලද පහත සඳහන් 2023 පරිපූරක ඇස්තමේන්තුව සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

## 2023 වර්ෂයේ පරිපූරක අයවැය

### ආදායම් සාරාංශය

| අනු අංකය | විස්තරය | 01 පොදු පරිපාලනය | 02 සෞඛ්‍ය සේවා | 03 භෞතික සැලසුම් | 04 ජල සේවා | 05 පොදු උපයෝගිතා සේවා | 06 සුභ සාධන සේවා | එකතුව (රුපියල්) | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | වරිපනම් හා බදු | 61,200.00 | | | | | | 61,200.00 | 1.80 |
| 20 | කුලී | | | | | | | - | - |
| 30 | බලපත්‍ර | | | | | | | - | - |
| 40 | සේවා සඳහා ගාස්තු | 279,549.27 | | | | | | 279,549.27 | 8.21 |
| 50 | වරෙන්තු ගාස්තු හා | | | | 500.00 | | | 500.00 | 0.01 |
| 60 | වෙනත් ආදායම් | 58,538.43 | | 6,000.00 | | | | 64,538.43 | 1.89 |
| 70 | ආදායම් ආධාර | | | | | | | - | - |
| 80 | ප්‍රාග්ධන ආධාර | | | 3,000,000.00 | | | | 3,000,000.00 | 88.09 |
| | එකතුව | 399,287.70 | - | 3,006,000.00 | 500.00 | - | - | 3,405,787.70 | 100.00 |

## 2023 වෂර්යේ පරිපූරක අයවැය
### වියදම් සාරාංශය

| අනු අංකය | විස්තරය | 01 පොදු පරිපාලනය | 02 සෞඛ්‍ය සේවා | 03 භෞතික සැලසුම් | 04 ජල සේවා | 05 පොදු උපයෝගිතා සේවා | 06 සුභ සාධන සේවා | එකතුව (රුපියල් ) | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|
| 101 | වැටුප් හා දීමනා | 20,000.00 | | | | | | **20,000.00** | **0.59** |
| 102 | ගමන් වියදම් | 60,000.00 | | | | | | **60,000.00** | **1.76** |
| 103 | සැපයුම් හා උපකරණ | 205,787.70 | | | | | 50,000.00 | **255,787.70** | **7.51** |
| 104 | ප්‍රග්ධන වත්කම් අළුත් වැඩියා හා නඩත්තු | 2,250,000.00 | | 750,000.00 | | | | **3,000,000.00** | **88.09** |
| 105 | ප්‍රවාහන සම්බන්ධතා | 10,000.00 | | | | | | **10,000.00** | **0.29** |
| 106 | පොලී ගෙවීම | 60,000.00 | | | | | | **60,000.00** | **1.76** |
| 107 | ආධාර මුදල් හා සහනාධාර | | | | | | | - | - |
| 108 | විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ | | | | | | | - | - |
| 109 | ප්‍රාග්ධන වියදම් | | | | | | | - | - |
| | එකතුව | **2,605,787.70** | **-** | **750,000.00** | **-** | **-** | **50,000.00** | **3,405,787.70** | **100.00** |
| | | | | | ආදායම් | | **3,405,787.70** | | |
| | | | | | වියදම් | | **3,405,787.70** | | |
| | | | | | අතිරික්තය /ඌනතාවය | | - | | |

III. මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් එක්රැස් කරන කසළ සම්බන්ධයෙන් පහත යෝජනා සඳහා ඉදිරි කටයුතු කිරිමට අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1. මීගහකිවුල නගර සීමාව තුළ සතියේ දින 06 එක්රැස් කරන කසළ පහත සඳහන් දින තුළදි පමණක් එක්රැස් කිරිම සිදු කිරිම.

    a) සඳුදා දින
    b) බදාදා දින
    c) සිකුරාදා දින
    d) සෙනසුරාදා දින

2. 2013 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කරන ලෙස සහ ව්‍යාපාරික ස්ථානවලින් පමණක් කසළ බද්දක් අය කිරීම.

2024-2028 වර්ෂ 05 සඳහා සකස් කරන ලද ඝණ අපද්‍රව්‍ය උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත කොයිකා ව්‍යාපෘතියේ යෝජනා සහ දැනට ක්‍රියාත්මක වන ක්‍රියාවලියේ ක්‍රියාකාරම් අදාල කර ගනිමින් සැලැස්ම සකස් කරන ලෙස කළමනාකරණ කමිටුව විසින් උපදෙස් ලබා දෙන ලදී.

IV. මීගහකිවුල ප්‍රාදේශීය සභාව 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන සැකසීමේ කටයුතු දැනටමත් සිදුවෙමින් පවතින අතර, එහිදි අප ප්‍රාදේශීය සභාවේ තැන්පත් ලේඛනයෙහි පවතින අවුරුදු දෙකකට වැඩි තැන්පත් ආදායමට ගැනීමට සිදු වේ.
එබැවින්, තැන්පත් ලේඛණයෙහි පවතින තැන්පත් ආදායමට ගැනීමේදී සිදුවනුයේ ගිණුම් ක්‍රියාවලියට අනුව, තැන්පත් ලේඛනයෙන් ඉවත් කර සමුච්චිත අරමුදලට බැරවීම යන ද්විත්ව සටහන් ක්‍රියාවලියක් පමණක් බව වැඩිදුරටත් දන්වා සිටින අතර, ඒ සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලද අතර, තවද 2021 වර්ෂයේදි

ඉල්ලීම් කල කළමනාකරණ සේවා නිලධාරී කේ.එම්.ඒ.ඩබ්.වුලවංශ මහතාගේ ගමන් වියදම සම්බන්ධව 2023 වර්ෂයේ ඔහුගේ ඉල්ලීම් ලිපියක් ලබා දෙන ලෙස දැන්වූවද එය ලබා දීමට ඔහු අපොහොසත් වූහෙයින් එම ණයහිමි ශේෂය 2023 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශවලින් ඉවත් කිරීම සඳහා ඔහු හට නැවතත් සිහිකැඳවීම් ලිපි යොමු කර ඒ සඳහාත් ඔහුගෙන් පිළිතුරක් නොමැති වුවහොත් ණයහිමි ලේඛණයෙන් ඉවත් කර ආදායමට ලබා ගැනීම අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

V. රජයේ කත්සේරු දෙපාර්තමේන්තු අංක BD/RP/2428 හා 2023.10.23 දිනැති ලිපිය මඟින් මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලය ඉදිරිපිට කඩ කාමරය සඳහා ඉදිරිපත් කර ඇති තක්සේරු වාර්තාවේ සඳහා හා එම තක්සේරු වාර්තාව මීගහකිවුල ප්‍රාදේශීය සභාව පිළිගැනීමට අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

VI. 2022 වර්ෂයේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ඌණව පැවති භාණ්ඩ පිළිබඳව ද, සංවර්ධන නිලධාරී එස්.එම්.නවෝදා දිලිනි මෙය වෙත විෂයට අදාල ලිපි ගොනු භාර දීමේදී ද ඌණ භාණ්ඩ පිළිබඳ එම කාල වකවානුවේ සේවය කරන ලද චන්ද්‍රා මැණිකේ මහත්මියගෙන් කරුණු විමසා 2023.08.04 දින ලිඛිතව දැන්වූවද 2023.11.14 වන තෙක් ඒ පිළිබඳ කරුණු වාර්තා කර නොමැත. එබැවින් භාණ්ඩ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

VII. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු RD-6200 ට්‍රැක්ටර් රථය 2023.11.08 දින අනතුරකට ලක්වුනු අතර එම ට්‍රැක්ටර් රථය අළුත්වැඩියා කිරීමට අදාළ අනුමැතිය සහ අදාල කාර්යය පටිපාටිය අනුගමනය කර ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

VIII. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කසල ටේලරය අළුත්වැඩිය කිරීම සඳහා අවශ්‍ය කාර්යය පටිපාටිය අනුගමනය කර ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

IX. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු UPRD-6200, කසළ ටේලරය, UPRB-9997 ට්‍රැක්ටර් රථය හා 270-1735 ට්‍රැක්ටර් රථය අළුත්වැඩියාව සඳහා වැඩමුලික නිර්දේශ ලබා ඇත. එම අළුත්වැඩියාව සිදු කිරීම සඳහා අවශ්‍ය කාර්යය පටිපාටිය අනුගමනය කර ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

X. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මීගහකිවුල සතිපොළ 2023 වර්ෂයට බදු ලබා ගෙන ඇති මීගහකිවුල, කිවුල, තෙල්දෙණියේ ගෙදර ලිපිනයෙහි පදිංචි ඒ.ඩබ්.රෝහණ ජයසිංහ මහතා තැම්පත් මුදල් ලෙස ලබා ඇති මාස 03 ක මුදල 2023 ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් යන මාස 03හි බදු මුදල් සඳහා හිලව් කර ගන්නා ලෙස ඉල්ලීම් කර ඇති නමුත් ටෙන්ඩර් ලබා දී ඇත් කාල සීමාවේ මීගහකිවුල සතිපොලෙහි යම් අලාභ හානියක් සිදු වුවහොත් එම අලාභය පියවා ගැනීම සඳහා තබා ඇති ඇප තැම්පත් මුදල 2023.12.31 දක්වා රඳවා ගත යුතු අතර එම නිසා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සඳහා කමිටු නිර්දේශය ලබා දිය නොහැකි බව කමිටුව විසින් තීරණය කරන ලදී,

XI. මීගහකිවුල බල ප්‍රදේශයේ ස්ටෝරුවේ ගෙදර, මීගහකිවුල යන ලිපිනයෙහි පදිංචි එච්.ඩී.එම්.ගුණසේකර මහතාගේ ඉඩමෙහි පිහිටි මාර ගසක අතු මීගහකිවුල, සඳසිරි නිවස, ලිපිනයෙහි පදිංචි එච්.ඩී.එම්.අනුලාවතී මියගේ නිවසට අවදානම් ලෙස පිහිටා ඇති අතර එම ගසෙහි අතු ඉවත් කර ගැනීමට මිල ගණන් කැඳවීම සිදු කිරීම සඳහා සහ ගසේහි අතු කපා ඉවත් කිරීමට සඳහා වැය වන මුදල අදාල පාර්ශවයෙන් අය කර ගන්නා ලෙස ලිඛිතව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

XII. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 ඔක්තෝම්බර් මස මාසික ආදායම් විශ්ලේශණ වාර්තාව සලකා බලන ලදී.

XIII. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 ඔක්තෝම්බර් මස මාසික ගෙවීම් විශ්ලේශණ වාර්තාව සලකා බලන ලදී.

XIV. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 ඔක්තෝම්බර් මස සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සලකා බලන ලදී.

මීළඟට න්‍යාය පත්‍රාණුකූලව වෙනත් කරුණු ඉදිරිපත් කරන ලදී.

1. පෝස්ට් මාස්ටර් ජනරාල්ගේ මහජන බැංකුවේ අංක 010100179027344 ගිණුමට බැර - නිදහස් තැපැල් මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.)මහත්මියගේ ස්තුති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.10.30ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
2) ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා (කමිටු සාමාජික) -
3) ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා (කමිටු සාමාජික) -
4) ජී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) -
5) ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) -
6) කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා (කමිටු සාමාජික) -